**හැඳින්වීම**

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශය මගින් මේ වන විට සමාජ විද්‍යාව පිළිබඳ සාමාන්‍ය ශාස්ත්‍රවේදී හා විශේෂ ශාස්ත්‍රවේදී උපාධි (අභ්‍යන්තර) සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි, ශාස්ත්‍රපති, සමාජීය විද්‍යාපති, දර්ශනපති සහ දර්ශනශූරි උපාධි පාඨමාලා ක්‍රියාත්මක කෙරේ. එසේම බන්ධනාගාර නිලධාරීන් සඳහා වන විශෝධනය හා පුනරුත්ථාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හා බන්ධනාගාර නිලධාරීන් සඳහා වන උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් ද හඳුන්වා දී ඇත. සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වා දීම අද්‍යතන ජාතික අවශ්‍යතාවක් පරිපූර්ණ කිරීමක් සේ හඳුනාගත හැකි වන අතර එය විශ්වවිද්‍යාල ක්ෂේත්‍රය තුළ සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දෙනු ලබන පළමු අවස්ථාව ද වේ.

**අරමුණු**

මෙම පාඨමාලාව ඉදිරිපත් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ රාජ්‍ය සහ රාජ්‍ය නොවන අංශයන්හි සේවා නියුක්තිකයන්ගේ සමාජ විද්‍යාත්මක දැනුම පුළුල් කිරීමත් සහ මානව ක්‍රියාකාරීත්වය විද්‍යාත්මකව හැදෑරීමට අවස්ථාවක් ලබාදීමත්ය.

**කාලසීමාව**

පාඨමාලා කාල සීමාව වසරකි.

**දේශන පැවැත්වීම**

විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන් මගින් දේශන කටයුතු සිදු කෙරේ.

දේශන ඉරිදා දිනයන්හි දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කැලණිය විශ්වවිද්‍යාලයේ දී පැවැත්වේ.

**ඇතුළත්වීමේ ක්‍රමවේදය**

අ.පො.ස. උසස් පෙළ විෂයන් තුනකින් සමත්වීම මූලික සුදුසුකම වන අතර වාර්ෂිකව සිසුන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ. පාඨමාලාව සඳහා ඇතුළත් කර ගනු ලබන උපරිම සිසුන් සංඛ්‍යාව සමාජ විද්‍යා අධ්‍යයන අංශය මගින් තීරණය කෙරේ. අපේක්ෂකයින් තෝරා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් සිදු කෙරේ.

**විෂය මාලාව**

සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව විෂය ඒකක හයකින් සමන්විතය.

SOCI 13015 – සමාජ විද්‍යාව පිළිබඳ හැඳින්වීම

SOCI 13025 – පුරෝගාමී සමාජ විද්‍යා චින්තකයෝ

SOCI 13035 – සමාජ පර්යේෂණ විධි ක්‍රම

SOCI 13045 – සංස්කෘතිය හා සංවර්ධනය

SOCI 13055 – සමාජ ප්‍රශ්න

SOCI 13065 – සමාජ මනෝ විද්‍යාව

**ඉගැන්වීම් මාධ්‍යය** - සිංහල

**පාඨමාලා ගාස්තුව**

ලියාපදිංචි ගාස්තු සහ විභාග ගාස්තු ඇතුළත්ව පාඨමාලා ගාස්තුව රු. 41, 000.00 කි.

**විමසීම්**


පාඨමාලා සම්බන්ධීකාරක,

සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව,

සමාජ විද්‍යා අධ්‍යයන අංශය,

කැලණිය විශ්වවිද්‍යාලය,

කැලණිය.

011 2 903 930
011 2 903 939